# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2341/52 - 2023 ජූලි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2023.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 01/2012 (IV)

**1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත**

1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වන වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ධීවර අමාත්‍ය.

2023 ජූලි මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2017 අගෝස්තු 14 දින අංක 2032/5 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2017 අංක 01 දරන අපනයන සඳහා කෘතිම උපස්ථර මත කොරල් විශේෂ වගා කිරීමේ නියෝගවල 6 වන නියෝගයේ සඳහන් "වගා කිරීමේ කටයුතු මධ්‍ය වඩදිය ඉම සිට කිලෝ මීටර් දහයක් (10km) රට අභ්‍යන්තරයට වන සීමාවක් ඇතුළත පිහිටි පරිශ්‍රයක සිදු කළ යුතු අතර" යන වචන හා ඉලක්කම් වෙනුවට "වගා කිරීමේ කටයුතු මධ්‍ය වඩදිය ඉම සිට කිලෝ මීටර් එකක (01km) සීමාව තුළ සිදු කිරීමෙන් බැහැර විය යුතු අතර එම සීමාවේ සිට කිලෝ මීටර් නවයක් (09km) රට අභ්‍යන්තරයට වන සීමාවක් ඇතුළත පිහිටි පරිශ්‍රයක සිදු කළ යුතු අතර" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

EOG 07-0188